055286
ML/PR
2017/07/08

# ශාන්තිකර්ම චිකිත්සාව

055286

ජනක විරාජිත් ශශිප්‍රිය පුස්සේවෙල
DD/MP/DA/08/016
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය,
පශ්චාද් උපාධි කේන්ද්‍රය

ප්‍රාසංගික කලාපති දෑ අවුරුදු උපාධිය (M.P.A)
2015 - අගෝස්තු

# හැඳින්වීම

ස්වීයාත්මය ස්වාධීනව පවත්වා ගැනීමේ අභියෝගයට මුහුණ පෑමේ ක්‍රියාවලියේ දී අදෘශ්‍යමාන බලවේග තමාගේ හාත්පස ක්‍රියාත්මක වන බව අවබෝධ කරගැනීමට ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මිනිසා යත්න දැරී ය. එසේ වූයේ ඒ කෙරෙහි අවනත වීමෙන් විනා තාර්කික මනසින් නොවේ. කල්යත් ම ස්වාභාවික අව්ව, වැස්ස, සුළඟ පමණක් නොව කඳු පර්වත, මළවුන් ආදියේ සැඟවුණු බලවේග තම ජීවිතයට බලපෑම් එල්ල කරතැ'යි සිතූ මිනිසා ඒවා පූජනීයත්වයෙන් සලකා වැඳුම් පිදුම් කිරීමට පෙළඹිණි.

අදෘශ්‍යමාන පිරිස් කෙරෙහි ආසක්ත වූ මිනිසා ස්වකීය ජීවිත පැවැත්මෙහි අනේක විධ ගැටලු දුක් කම්කටොලුවලදී විවිධාකාර කෘත්‍යයන් සිදුකොට සෙත අපේක්ෂා කළේ ය. මිනිසාට ඇතිවන යහපත් හා අයහපත් දෑ නොපෙනෙන බලවේගයන්ගේ ක්‍රියාකාරීත්වයට පවරා දුන් හෙතෙම නොයෙකුත් පුද පූජා වතාවත් සිදුකොට සිය අභිලාෂයන් සඵල කරගැනීමට යත්න දැරී ය. මෙම ප්‍රයත්නය ශතවර්ෂාධික කාලයක් පුරා විකාසනයේ ප්‍රතිඵලයක් වශයෙන් ශාන්තිකර්ම ප්‍රභවය ලැබී ය.

විවිධ ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු සිංහල ශාන්තිකර්ම පද්ධතිය විවිධ සමාජ අපේක්ෂා පෙරදැරි කොට ප්‍රාග් බෞද්ධ යුගයේ සිට විකාසනය වූව කි. දෙවියන්, යකුන්, ග්‍රහයින් අරමුණු කරගත් තත් ක්‍රියාවලිය මිනිසාගේ සුවතාව අරමුණු කරගත් අතර, කායික, මානසික, හා සමාජ විද්‍යාත්මක වටිනාකම් ප්‍රදර්ශනය කරයි. දේශීය ශාන්තිකර්ම වූ කලී විධිමත් ක්‍රමවේද මත තර්කානුකූලව, ගොඩනගන ලද චිකිත්සක ක්‍රියාවලියක් බව අතිශයෝක්තියක් නොවේ. එය අනාදිමත් කාලයක පටන් ශ්‍රී ලාංකිකයින්ගේ කායික මානසික නිරෝගී භාවය අරමුණු කර ක්‍රියාත්මක විය. භෞතික විද්‍යාත්මක සංකල්ප පදනම් කර අවිද්‍යාවක් යැයි ඇතැමුන් විසින් බැහැර කරනු ලැබූ ශාන්තිකර්මයන්හි සත්‍ය ලෙස ම දෘශ්‍යමාන වන චිකිත්සක ලක්ෂණ මෙන් ම එහි ප්‍රායෝගික හා විද්‍යාත්මක ස්වරූප අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ශාන්තිකර්ම චිකිත්සාව ප්‍රාථමික ජන වෙදකමක් (folk medicine) පමණක් නොවේ. එය ආයුර්වේද ශාස්ත්‍රය සමඟ ගොඩනැගුණු දියුණු වෛද්‍ය ශාස්ත්‍රයක අගනාකම් ප්‍රදර්ශනය කෙරෙන වෛද්‍ය ශාස්ත්‍රයකි. ශාන්තිකර්ම සමාජ හා මානව විද්‍යා ක්ෂේත්‍රයන්හි පවා පුද්ගලයාගේ කායික මානසික නිරෝගී භාවය උදෙසා මෙන් ම සමාජ කාරකයක් ලෙස ද සමාජ පැවැත්මට දක්වන ධනාත්මක කෘත්‍ය ඇගයීමට ලක්කරයි. චිකිත්සක මෙවලමක් වශයෙන් ශාන්තිකර්ම කෘත්‍ය ඇගයීමට ලක්කිරීමේ දී ඒ තුළ පවත්නා විද්‍යාත්මක බව හා එහි ප්‍රශස්ත චිකිත්සක ක්‍රම ශිල්පයන් දියුණු බටහිර, වෛද්‍ය ශාස්ත්‍රය අභිබවයි.

ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම පද්ධතිය පුළුල් චිකිත්සක සමාජයක් වන අතර එහි වෛද්‍යවරයා, ඖෂධ, ආතුරයා, මෙහෙකරුවා යන සිවු පුද්ගල සමායෝගය චිකිත්සාවට මූලික වේ. මොවුහු ශාන්තිකර්ම ක්‍රියාවලියේ නියමුවන් වශයෙන් ක්‍රියාකරන අතර විධිමත් සංවිධානාත්මක බවකින් යුතුව ස්වකීය ක්‍රියාවලිය බලගන්වති. මෙහි ලා ඇඳුරු භූමිකාව ප්‍රබල වන අතර හේ පුළුල් අත්දැකීම් සම්භාරයක් මත සිය කාර්ය සාධනයෙහිලා කටයුතු කරයි. චිකිත්සක ක්‍රියාවලියේ දි චිකිත්සක වශයෙන් ඇඳුරු භූමිකාව සතු ශක්‍යතා මෙන්ම චර්යාත්මක ලක්ෂණ අදාළ කාර්ය පණ ගැන්වීමට කෙරෙන සජීවී දායකත්වය පර්යේෂණයේ දී අවධානයට පාත්‍ර විය.

චිකිත්සක වශයෙන් ශාන්තිකර්ම ශිල්පියා ස්වකීය ක්‍රියාවලිය තුළ ප්‍රතිකර්ම සිදුකරන ක්‍රමවේදයන් රාශියක් වන අතර, ඇතැම් ඒවා බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයෙහි ප්‍රතිකාර සඳහා භාවිත බව ප්‍රත්‍යක්ෂ විය. බටහිර මනෝ වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිකාර ශිල්ප ක්‍රම වෙන් වෙන් ප්‍රතිකාර අවස්ථා ලෙස පැවතිය ද ශාන්තිකර්ම චිකිත්සාව ඊට වඩා වෙනස් වූව කි. එය චිකිත්සාවලිය කි. බොහෝ චිකිත්සක ක්‍රමවේදයන් සංකලනය කොට සිදුකරන සංවිධිත චිකිත්සාව කි. එය ඉතා සියුම් ලෙස විශ්ලේෂණය කර අවබෝධ කරගත යුත්තක් බව මෙහි දී පෙන්වා දෙනු ලැබී ය.

මෙහිලා පර්යේෂණයට බඳුන් වූ සන්නියකුම හෙවත් දහඅට සන්නිය, සූනියම් කැපීමේ යාගය, මෙන්ම බලියාගය පැවැත්වීමේ අරමුණු හා එය ප්‍රතිකාරී සංසිද්ධියක් වශයෙන් සැලකුවහොත් විවිධත්වයක් ප්‍රදර්ශනය කරයි. එහි දී ශාන්තිකර්ම ශිල්පීහු චිකිත්සාව සඳහා භාවිත ක්‍රම ශිල්පයන්හි විවිධත්වයක් ප්‍රදර්ශනය කරති. ඔවුන් පියවර ක්‍රමය මත සිය චිකිත්සක ක්‍රියාවලිය ගොඩ නංවන අපූර්වත්වය හා එහි නවමු බව පර්යේෂණයේ දී අනාවරණය විය. උත්තේජන ප්‍රතිචාර න්‍යායන් පුද්ගල මනස හා සියුම් ලෙස බද්ධ කරන ශාන්තිකර්ම ශිල්පියා ගේ නිරෝගීභාවය උදෙසා සිදුකරන විධිමත් සැලසුමේ ප්‍රායෝගික ස්වරූපය පර්යේෂණයේ දී, තහවුරු විය. තත් ක්‍රියාවලිය තුළ දක්නට ලැබෙන බව බොහෝ අවස්ථා විශ්වය හා බැඳී භෞතික විද්‍යාත්මක සංකල්පයන්ගෙන් පවා සුපෝෂිත බව භෞතික විද්‍යාත්මක කරුණු හරහා ශාන්තිකර්ම විශ්ලේෂණයේ දී ප්‍රත්‍යක්ෂ විය.

ශාන්තිකර්ම චිකිත්සාව පුද්ගල මනස අරමුණු කර ගත්ත කි. ඉන් පුද්ගල මනසට ඇතිකරන බලපෑම ආතුරයාගේ කායික මානසික සුවතාවට ඉවහල් වේ. එය පාරම්පරික දියුණු වෛද්‍ය ශාස්ත්‍රයක් ලෙස විද්‍යාත්මක ලක්ෂණ ප්‍රදර්ශනය කළ ද සමාජ පිළිගැනීමට ලක් නොවීම ගැටලුව කි. එහෙයින් ශාන්තිකර්ම අවිද්‍යාත්මක ක්‍රියාවලියක් නොව විද්‍යාත්මක වූ සංවිධානාත්මක ක්‍රියාවලියක් ම බව පැහැදිලි ය.